# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.05 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 18 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

### 01. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාම - කිලිනොච්චිය පොලිස් වසම.

2025.01.04 වන දින සවස් කාලයේදී කිලිනොච්චිය පොලිස් වසමේ බයිරවල් කෝවිල නැගෙනහිර ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු විදුලි සැරවැදී මියගොස් ඇති බවට කිලිනොච්චිය පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 30 ක් වූ පරන්තන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු ගොයම් කපන යන්ත්‍රයක් සෝදමින් සිටියදී ඒ අසල නිවසේ තිබූ ස්විච්චයකට ජලය කාන්දු වීමෙන් විදුලි සැර වැදී මියගොස් ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කිලිනොච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. තීරුබදු නොගෙවා රන් භාණ්ඩ රැගෙන එන ලද පුද්ගලයෙකු අත්අඩංගුවට - ගුවන්තොටුපල පොලිස් ස්ථානය.

2025.01.04 වන දින රාත්‍රී කාලයේ ගුවන්තොටුපල පරිශ්‍රය තුලදී අබුඩාබි සිට මෙරටට පැමිණි ගුවන් මගියෙකු පිලිබඳ බුද්ධි අංශ නිලධාරීන්ගෙන් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර තිරුබදු නොගෙවා නීති විරෝධී ලෙස මෙරටට රැගෙන ලද රන් භාණ්ඩ සමග සැකකරුවෙකු ගුවන්තොටුපල පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු සන්තකයේ තිබී රන් මාල 04ක්, පෙන්ඩන්ට් 01ක්, අත් පලඳනා 02ක්, රන් වළලු 01ක් සහ රන් මුදුවක් පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන වෙලම්බොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගුවන්තොටුපල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2025.01.04 වන දින සවස් කාලයේදී දෙමටගොඩ පොලිස් වසමේ ඇස්කෝන් නිවාස සංකිර්ණ ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 330 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු මත්ද්‍රව්‍ය ජාවාරමෙන්

උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 56400/=ක් සමග අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී කොළඹ මහාධිකරණයෙන් හා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය මගින් විවෘත වරෙන්තු නිකුත් වී ඇති බවටද අනාවරණය වී ඇත.

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. හෙරොයින් හා අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මෝදර පොලිස් ස්ථානය.

2025.01.04 වන දින දහවල් කාලයේ මෝදර පොලිස් වසමේ ලෙල්ලම හා තොටලඟ ප්‍රදේශ වලදී මෝදර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීම් 02ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 400 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 100ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 38 හා 49 යන වයස්වල පසුවන මෝදර හා මුන්දලම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී එක් සැකකරුවෙකු 2025.01.03 වන දින කාන්තාවකගේ ගෙලබැඳි රන්මාලයක් කොල්ලකෑමේ අපරාධයට සම්බන්ධ සැකකරු බවට අනාවරණය වී ඇත.

මෝදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.

2025.01.04 වන දින සවස් කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ අතුරුගිරිය නගරයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.

2025.01.04 වන දින සවස් කාලයේ ගම්පහ පොලිස් වසමේ නැදගමුව ප්‍රදේශයේදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 600 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2025.01.04 වන දින සවස් කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ෆර්ගියුෂන් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 750 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බෙම්මුල්ල පොලිස් ස්ථානය.

2025.01.04 වන දින උදෑසන කාලයේ බෙම්මුල්ල පොලිස් වසමේ පෙතියාගොඩ ප්‍රදේශයේදී බෙම්මුල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 1059 ක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන පෙතියාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බෙම්මුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. නීති විරෝධී මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

2025.01.04 වන දින දහවල් කාලයේ හංවැල්ල පොලිස් වසමේ පුස්සැලිඔය වේල්ල ප්‍රදේශයේදී නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 1098 ක්, නීති විරෝධී මත්පැන් ලීටර් 135ක් හා පෙරීමේ උපකරණ** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හංවැල්ල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 65 ක් වන පාදුක්ක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හංවැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගිරිබාව පොලිස් ස්ථානය.

2025.01.04 වන දින දහවල් කාලයේ ගිරිබාව පොලිස් වසමේ ඉහල මරදන්කඩවල ප්‍රදේශයේදී ගිරිබාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද

තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 හා 52 යන වයස්වල පසුවන පහල ගිරිබාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ගිරිබාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොබෙයිගනේ පොලිස් ස්ථානය.**

2025.01.04 වන දින රාත්‍රී කාලයේ කොබෙයිගනේ පොලිස් වසමේ කොස්ගහවැව හන්දිය ප්‍රදේශයේදී කොබෙයිගනේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන අලව්වේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොබෙයිගනේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් හත්දෙනෙකු අත්අඩංගුවට - දෙහිඕවිට පොලිස් ස්ථානය.**

2025.01.04 වන දින රාත්‍රී කාලයේ දෙහිඕවිට පොලිස් වසමේ අටළුගම මීවලකන්ද ප්‍රදේශයේදී දෙහිඕවිට පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් හත් දෙනෙකු කැණීම් උපකරණ හා පූජා භාණ්ඩ සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25ත් 56ත් අතර වයස්වල පසුවන සීදූව දෙහිඕවිට ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

දෙහිඕවිට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

2025.01.04 වන දින උදෑසන කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ රොමියල් මාවත ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු කැණීම් උපකරණ හා පූජා භාණ්ඩ සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24, 28 හා 41 යන වයස්වල පසුවන පනාගොඩ හා හිරිපිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**14. මාරක රිය අනතුරක් - ඇඹිලිපිටිය පොලිස් වසම.**

2025.01.04 වන දින උදෑසන කාලයේ ඇඹිලිපිටිය පොලිස් වසමේ රත්නපුරය ඇඹිලිපිටිය ප්‍රධාන මාර්ගයේ ගල්වංගුව ප්‍රදේශයේදී උඩවලව දෙස සිට ඇඹිලිපිටිය දෙසට ධාවනය වූ බස් රථයක් බස් නැවතුමේ නවතා මගීන් රැගෙන එම

නැවතුමෙන් නැවත ධාවනය කිරීමේදී ස්ථානයේ සිටි මගී කාන්තාවක් බස් රථයේ පිටුපස රෝදයට හසුවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ මගී කාන්තාව ඇඹිලිපිටිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 62 ක් වූ නින්දගම්පැලැස්ස ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බස් රථ රියදුරු හා කොන්දොස්තර්වරයා අත් අඩංගුවට ගෙන ඇත. ඇඹිලිපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - ආනමඩුව පොලිස් වසම.

2025.01.04 වන දින සවස් කාලයේ ආනමඩුව පොලිස් වසමේ ආඩිගම කීරියන්කල්ලිය මාර්ගයේ කට්ටුව ප්‍රදේශයේදී ආඩිගම දෙස සිට කීරියන්කල්ලිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගය අයිනේ ගමන් කල පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු හා පදික පුද්ගලයා ආනමඩුව රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පදික පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 51 ක් වූ කට්ටුව, ආඩිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ආනමඩුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ආනමඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 16. මාරක රිය අනතුරක් - පොතුහැර පොලිස් වසම.

2025.01.04 වන දින දහවල් කාලයේ පොතුහැර පොලිස් වසමේ දම්බොක්ක රඹුක්කන මාර්ගයේ තෝරවතුර ප්‍රදේශයේදී දම්බොක්ක දෙස සිට රඹුක්කන දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව යතුරුපැදිය මාර්ගයේ පෙරලීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 24ක් වූ රඹුක්කන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පොතුහැර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 17. මාරක රිය අනතුරක් - කටුවන පොලිස් වසම.

2025.01.04 වන දින උදෑසන කාලයේ කටුවන පොලිස් වසමේ කටුවන ඌරුබොක්ක මාර්ගයේ රුක්මල්පිටිය ප්‍රදේශයේදී බෙංගමුකන්ද දෙස සිට කටුවන දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් එහි පැමිණි මගීන් බස් නැවතුමේ බස්සවා බස් රථය ධාවනය කරන අවස්ථාවේ මගියෙකු බස් රථයට ඉදිරියෙන් මාර්ගය හරහා මාරුවීමට යාමේදී එම බස් රථයට යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ මගී පුද්ගලයා එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 67 ක් වූ බෙංගමුකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බස් රථ රියදුරු අත් අඩංගුවට ගෙන ඇත. කටුවන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 18. මාරක රිය අනතුරක් - නිට්ටඹුව පොලිස් වසම.

2025.01.04 වන දින උදෑසන කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ සපුගස්තැන්න හංදියේදී වේයන්ගොඩ දෙස සිට හුඹුටියාව දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයේ පෙරලීගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු වතුපිටිවල රෝහලට ඇතුලත් කිරීමෙන් මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ වේයන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු මෘත ශරීරය ඥාතීන් වෙත භාරදී ඇති අතර නිට්ටඹුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**